# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ හා II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 II (2026)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව 2026.03.27දිනැතිව නිකුත් කරන ලද සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක 13/ 2026 අනුව අයදුම්පත් කැඳවූ ඉහත සඳහන් විභාගය පහත සඳහන් දින වලදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දී ඇත.

| | |
|---|---|
| III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා - | **2026 ජූනි මස 27 දින කොළඹදී** |
| II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා - | **2026 ජූනි මස 28 දින කොළඹදී** |

02. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කර ඇති අයදුම්පතක් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **විභාග ප්‍රවේශපත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මඟින් දන්වනු ලැබේ.**

03. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

04. ප්‍රවේශපත්‍ර පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

05. මෙම විභාගය සම්බන්ධයෙන් සියළු විස්තර සහිතව නිකුත් කරන ලද සබරගමුව පළාත් කොමිෂන් සභා චක්‍රලේඛය **www.sg.gov.lk හා www.psc.sg.gov.lk** වෙබ් අඩවිවල පළකර ඇත.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත
2026 . 05. 22

**ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත**